සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

දෙවන වාර ඇගයීම - 2018
,உணஷலஹகஷ ஜடஇண கஜபகஷகப்ல்
Second Term Evaluation

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 6 | විෂයය / பாடம் / Subject: සිංහල භාෂාව හා සාහිත්‍යය | පත්‍රය / வினாத்தாள் / Paper: I/II | පැය / மணித்தியாலம் / Hours: 02 |

නම
ŋகஅஉஷ ------------------------------------------------
Name

පළමු කොටසෙහි අංක 1 සිට 20 තෙක් ඇති ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු ලියන්න. 1,11 පිළිතුරු පත්‍ර එකට අමුණා බාර දෙන්න.

## I කොටස

- අංක 01 සිට 03 තෙක් ප්‍රශ්නවල නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත වචනය තෝරන්න.

(1) නුපුරුදු හඬක් ඇසුණු විට ------------වීම අප කාගේත් සිරිත ය.

1. පරීක්සාකාරී 2. පරීක්ශාකාරී 3. පරීක්ෂාකාරී 4. පරීක්ශාබාරී

(2) මහණෙනි, මේ මාගේ පුරාතනයෙහි ---------------------

1. අධිශ්ඨානයෙකැ 2. අධිෂ්ඨානයෙකැ 3. අධිස්ඨානයෙකැ 4. අධිෂ්ටානයෙකැ

(3) ශ්‍රී ලංකාවේ --------------වාන පිහිටා ඇත්තේ කලා වැවේ ය.

1. විශිෂ්ටතම 2. විශිශ්ඨතම 3. විශිෂ්ඨතම 4. විශිශ්ටතම

- අංක 04 සිට 06 තෙක් ප්‍රශ්නවල සඤ්ඤක අක්ෂරය සහිත වචනය තෝරන්න.

(4) 1. ශ්‍රේණිය 2. ඥානය 3. පුළුන් 4. ඉඟුරු

(5) 1. ගැළපෙන 2. වර්ධන 3. සන්හිඳ 4. මංසල

(6) 1. ලාඤ්ඡන 2. තඹුරු 3. භූමිය 4. ධූපය

- අංක 07 හා 08 යන ප්‍රශ්න සඳහා වාක්‍ය හතරක් දී ඇත. නිවැරදි වාක්‍යය තෝරන්න.

(7) 1. නුඹ ගීයක් ලියයි. 2. රණරාල යෝජනා කළේ ය.
3. නංගී ගී ගැයුවේ ය. 3. මම පොතක් කියවයි.

(8) 1. කුරුල්ලන් අහසේ පියාසර කරති. 2. මව දරුවන් රැක්කේ ය.
3. මිතුරිය පොතක් තෑගි කළා ය. 4. ශිෂ්‍යයෝ පාඩම් කළේ ය.

- අංක 09 හා 10 ප්‍රශ්නවල විශේෂණ පදයක් සහිත වාක්‍යය තෝරන්න.

(9) 1. සිංහයා වනයේ හැසිරෙයි. 2. නංගී පාඩම් කරයි.
3. වනයෙහි පොකුණක් ඇත. 4. දිග හූවක් ඇසෙන්නට විය.

(10) 1. පක්ෂීහු කොළයාගේ සතුරෝ ය. 2. ශිෂ්‍යයා පුස්තකාලයට යයි.
3. අද කළුවර දවසකි. 4. ගුරුතුමා පාඩම ඉගැන්නුවේ ය.

- අංක 11,12,13 ප්‍රශ්න සඳහා මුලින් දී ඇති වචනවලට සමානාර්ථය දෙන වචනය තෝරන්න.

(11) තියුණු - 1. සියුම් 2. පියුම් 3. දියුණු 4. තිබුණු

(12) ද්වාරය - 1. කවුළුව 2. සිදුර 3. පතුල 4. දොර

(13) සමෘධ වන්නේ ය. - 1. සතුටු වන්නේ ය. 2. සාර්ථක වන්නේ ය.
3. ධනවත් වන්නේ ය. 4. සමතලා වන්නේ ය.

- අංක 14,15 ප්‍රශ්න සඳහා දී ඇති වචනවලට විරුද්ධාර්ථය දෙන වචනය තෝරන්න.

(14) ආගන්තුක 1. බැහැරින් පැමිණි 2. ආයතනික
3. පිටතින් පැමිණි 4. නේවාසික

(15) විදේශික 1. ආදේශක 2. ඒක දේශික 3. ස්වදේශික 4. නිර්දේශිත

- 16, 17 ප්‍රශ්න සඳහා දී ඇති වාක්‍යවල යෙදී ඇති විරාම ලකුණු නිවැරදි ව නම් කර ඇති පිළිතුර තෝරන්න.

(16) ''කිමෙක් ද? තෝ බැස පැන් බොති යි සිතන්නේ දැ''

1. කොමා, ප්‍රශ්නාර්ථ ලකුණ 2. පෙරළි කොමා, ප්‍රශ්නාර්ථ ලකුණ

3. තනි උඩු කොමා, කොමාව 4. කොමාව, පෙරළි කොමා

(17) අහෝ, ඒ සතාගේ දිග මහත!

1. තනි උඩු කොමා, විස්මයාදි ලකුණ. 2. කොමාව, ප්‍රශ්නාර්ථ ලකුණ

3. පෙරළි කොමා, තනි උඩු කොමාව. 4. කොමාව, විස්මයාදි ලකුණ

- 18,19,20 ප්‍රශ්න සඳහා දී ඇති වාක්‍යවල හිස්තැනට ගැළපෙන පිළිතුර තෝරන්න.

(18) ------------------- දුන්හිඳ ඇල්ල නැරඹූවෝ ය.

1. සංචාරකයෝ 2. සංචාරකයන් 3. සංචාරකයා 4. සංචාරකයකු

(19) තොපි දෙමව්පියන් ----------------

1. නමදින්නෙහි 2. නමදිති 3. නමදින්නෙහු 4. නමදිනු

(20) බොහෝ සිවු පා සත්තු වනයේ -------------

1. සැරිසැරුවේ ය. 2. සැරිසරති. 3. සැරිසරයි. 4. සැරිසරන්නේ ය.

(ලකුණු 2×20=40)

## II කොටස

- 1 හා 2 ප්‍රශ්න අනිවාර්යය වේ. 3, 4, 5, 6, 7 ප්‍රශ්නවලින් තුනක් තෝරා ගෙන ප්‍රශ්න පහකට පිළිතුරු ලියන්න.

(1) සිංහල විෂය සම්බන්ධයෙන් ඔබේ පන්තියේ ඇගයීම සඳහා පැවැත්වූ කියවීමේ තරගය ඇසුරෙන් පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

1. කියවීමේ තරගය සඳහා යොදා ගත් පාඩමක නම ලියන්න. ( ල 2)
2. කියවීමේ ශෛලීන් දෙකක් සඳහන් කරන්න. ( ල 2)
3. කියවීමේ තරගයට පෙර ඔබට ලැබුණු උපදෙස් දෙකක් ලියන්න. (ල 4 )
4. කියවීමේ පුරුද්ද වැඩි දියුණු කර ගැනීමෙන් ඔබට ලැබෙන ප්‍රයෝජන දෙකක් ලියන්න. (ල 4 )
5. ඔබ කණ්ඩායමේ ඉදිරිපත් කිරීම තුළ වඩාත් සිත් ගත් අවස්ථාවක් ලියා දක්වන්න. (ල 4 )

(ලකුණු 16 )

(2) පහත සඳහන් මාතෘකා අතුරින් එකක් තෝරා ගෙන වචන 125 ට නො අඩු වන සේ රචනයක් ලියන්න.

1. මිහිකත සුරකින තුරු ලිය
2. ලෝකෙට ම එකයි - මේ කලා වැවයි
3. මහනුවර යුගය සතු - කදිම හෙළ බොජුන් තතු
4. ගැල්කරුවකුගේ ජීවිතය

(ලකුණු 14)

(3) අන්තර් විද්‍යාලීය පද්‍ය ගායනා තරගයෙන් ප්‍රථම ස්ථානය දිනූ ඔබේ පන්තියේ මිතුරියකට /මිතුරෙකුට යැවෙන සුබ පැතුම් පත නිර්මාණය කරන්න.

(ලකුණු 10)

(4) වයිර ගොනා දණ ගහලා අදින කොට

මයිල ගොනා පැන්නයි පස්සට හොරට

මොකද කරන්නේ පූරුවේ කළ  පවට

-------------------------------------------------------

1. ඉහත පද්‍යයේ ඉතිරි පාදය සම්පූර්ණ කරන්න.
2. මෙහි සඳහන් සතුන්ගේ හැසිරීම කෙටියෙන් විස්තර කරන්න.
3. පද්‍යයෙන් අදහස් වන පරිදි ඔවුන්ට මෙබඳු දිවියක් උරුම වූයේ කුමක් නිසා ද?
4. ඉහත පද්‍යය කිනම් ජනකවි වර්ගයකට අයත් දැයි නම් කරන්න.
5. මෙම පද්‍යය කියවන විට ඔබ තුළ ඇති වන හැඟීම් වාක්‍ය දෙකකින් පමණ සඳහන් කරන්න.

(ල.2×5=10)

(5) පහත සඳහන් ප්‍රකාශ කවුරුන් විසින් කා හට කියන ලද්දේ දැයි ලියා වගුව සම්පූර්ණ කරන්න.

| ප්‍රකාශය | කවුරුන් විසින් ද? | කා හට ද? |
|---|---|---|
| 1. 'එදා නම් තොපට පින් දෙන්ට ද මට සිහි මඳ වියැ.' | ------------------------ | --------------- |
| 2. 'කිමෙක් ද? දරුවෙනි, පැන් නොබොව් දැ.' | ------------------------ | --------------- |
| 3. 'ඉතින් නැගිටින්න දෙ ඇස් පිහගන්න.' | ------------------------- | ------------- |
| 4. 'බොහොම ඉක්මනට ආවා නේ ද?' | ------------------------- | -------------- |
| 5. 'අම්මාව එක්ක යන්නේ මම .' | ------------------------ | ---------------- |

(ලකුණු 2×5=10)

(6) පහත ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

ශ්‍රී වික්‍රම රාජසිංහ රජුගේ ඔටුන්න 1820 ජුනි 13 වැනි දා තෝමස් කිං නම් තැනැත්තකු විසින් ලන්ඩන් නුවර කවන්ට් ගාඩ්න්හි රජ වීථියේ අංක 38 දරන සිය වෙන්දේසි පොළේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණන ලදි. ඒ සඳහා මුද්‍රණය කරන ලද පත්‍රිකාවෙහි එම ඔටුන්න පිළිබඳ කෙටි විස්තරයක් වේ. ඒ අනුව ඔටුන්න රනින් නිමවා තිබිණි. ප්‍රිය උපදවන හැඩයෙන් යුක්ත විය. පිටතට නෙරා ගිය කොන්වලින් යුතු විය. එම කොන්වලින් දියමන්තියෙන් හා රතු කැටයෙන් සැදි ආභරණ එල්විණි. මේවායින් දෙකක්

පමණක් ඉතිරි ව තිබිණැ යි පත්‍රිකාවේ සඳහන් විය. නළල වසා හිස වට ගිය රවුමෙහි රන් ආභරණ පසළොසක් විය. දියමන්ති හා රතු කැට ද එහි ඔබ්බා තිබිණි. මුදුනෙහි රන් තලියක් හා මුතු ඇට විය. ඉදිරිපසින් ඇනමල් ගෑ අලංකාර රන් ආභරණයක් එල්විණි. දියමන්ති රතුකැට හා නිල් කැටවලින් සැදි මෙය පිහාටුවක සිරිය ගත්තේ ය. ඔටුන්න මැද ඉතා අගනා විශාල රතු කැටයක් විය. පත්‍රිකාවට අනුව ඔටුන්නේ ඒ ඒ කොටස් වෙන වෙන ම මිල දී ගත හැකි වූ බව පෙනේ. ශ්‍රී වික්‍රම රාජසිංහ රජුට අයත් වී යැයි සැලකෙන ඔටුන්නක් දැනට කොළඹ කෞතුකාගාරයෙහි දක්නට ලැබේ.
(සිංහල විශ්ව කෝෂය 5වැනි කාණ්ඩය)

1. ඡේදයට අනුව ඔටුන්න විකුණූ ස්ථානය සහ දිනය සඳහන් කරන්න.
2. හිස වට ගිය රවුමෙහි තිබූ රන් ආභරණ සංඛ්‍යාව කීයද?
3. එහි ඔබ්බා තිබුණේ මොනවා ද?
4. 'පිහාටුවක සිරිය ගත්තේ ය' යන යෙදුමෙහි අර්ථය ලියන්න.
5. ඔටුන්න පිළිබඳ කෙටි විස්තරය ලැබුණේ කෙසේ ද? (ලකුණු 2×5=10)

(7) පහත පද්‍ය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

දුම්රිය ගාඩ් පදවිය මෙන් මිහිර දෙන
රස්සාවක් තවත් මේ ලොව ඇතිද වෙන
අතකින් නළාවයි අතකින් කොඩිය ගෙන
ඔහු යන්නේ ය අන්තිම පෙට්ටියට පැන

මම නම් ගාඩ් පදවිය ලත් වෙලා වට
චොකලට් ගෙනා නැන්දා දිය තලා වට
යන දුම්රියේ යම් කොඩියට නළා වට
ලන්තෑරුමට වැඩ දෙමි බල බලා වට
(ළමා හැඟුම්-පී.බී.අල්විස් පෙරේරා)

1. කවියා පවසන පරිදි ලොව මිහිරි ම රැකියාව කුමක් ද?
2. එම රැකියාව සඳහා අවශ්‍ය වන උපකරණ දෙකක් නම් කරන්න.
3. පළමු පද්‍යයට අනුව ගාඩ්වරයාට දුම්රියේ හිමි ස්ථානය කොතැන ද?
4. චොක්ලට් ගෙන ආවේ කවුරු ද?
5. 'පදවිය, කොඩිය' යන යෙදුම්වල අර්ථ ලියන්න.

( ලකුණු 2×5=10)